# කැස්බෑව නගර සභාව
# කොළඹ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කැස්බෑව නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මුදල් පොතේ 2011 දෙසැම්බර් 31 දිනට වූ රු.15,940,916 ක අයිරාව, ශේෂ පිරික්සුමට රු.15,737,992 ක් ලෙස ගෙන තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී සභාව වෙත ගෙවා තිබූ රු.32,329,841 ක මුද්දර ආදායම් අඩුකර ගෙන පළාත් ආදායම් කොමසාරිස් විසින් සමාලෝචිත වර්ෂයේ මුද්දර ආදායම් ලබා දී තිබුණද, අඩු කර ගෙන තිබූ මුද්දර ආදායම් ලැබිය යුතු ලෙසත් අඩුකර ගෙත තිබූ දීමනා රු.20,730 ක් ඉකුත් වර්ෂයේ වියදම් ලෙසත් ගිණුම් ගත කර තබුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් සභාව වෙත ලැබී තිබුණු ට්‍රැක්ටර් 04 ක්, ටේලර් 07 ක්, පරිගණක 04 ක්, රූපවාහිණි යන්ත්‍ර 02 ක්, අත් ට්‍රැක්ටර් 01 ක්, කුණු අදින අත් කරත්ත 08 ක්, දුමායන යන්ත්‍ර 01 ක් සහ රෝද පුටු 01 ක් වූ යන්ත්‍ර හා උපකරණ වල වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවහය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසාඑකතුව රු.35,425,969 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.3 නොසැසඳෙන පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.263,958,998 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමග සැසඳීමේදී වෙනස්කම් නිරීක්ෂණය වූ අතර, වෙනස්කම් වල එකතුව රු.7,876,952 ක් විය.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

සභාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම වෙනුවෙන් 2006 සිට 2010 දක්වා ගෙවිය යුතු රු.4,317,253 ක් විගණකාධිපති වෙත නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.105,445,736 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,755,019 ක් විය.

### 2.2. බැංකු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 261(3) හා 387 විධිවිධානයන්ට පටහැනිවබැංකු ජංගම ගිණුම අයිරා ගැන්වී තිබූ අතර බැංකුව විසින් අයකර තිබූ අයිරා පොලී පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව අයිරා ශේෂය | බැංකුව විසින් අයකර තිබුණු අයිරා පොලිය |
|---|---|---|
| | රු. | රු. |
| 2011 | 15,940,916 | 2,709,325 |
| 2010 | 15,631,859 | 2,358,240 |

(ආ) 2011 ජනවාරි හා ඊට පෙර තැන්පත් කල නමුත් මෙතෙක් උපලබ්ධි නොවූ වටිනාකම රු.10,302 ක් වූ චෙක් පත් 03 ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි.

(ඇ) එකතුව රු.291,382 ක් වූ අගරු චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) රු.4,581,918 ක මුදලක් වර්ෂය පුරා ඉතිරි කිරීමේ ගිණුමක පවත්වාගෙන යාම නිසා වාර්ෂිකව 4% බැගින් රු.185,184 ක පොලී ආදායමක් ලබා තිබුණද, මෙම මුදල

ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර වැඩි පොලී ආදායමක් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 22,163 | 30,502 | 25,020 |
| (ii) | බදු කුලී | 11,355 | 11,201 | 4,739 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,903 | 2,834 | 415 |
| (iv) | වෙනත් ආදායම් | 8,786 | 20,074 | - |

**2.4 අයවීමට ඇති සේවක ණය**

සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන් 20 දෙනෙකුගෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ රු.369,416 වූ ණය ශේෂ ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 11.10 හා 11.12.1 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.5 අවිධිමත් ගනුදෙනු**

ගබඩා ලැබීම් සටහන් 1354 ට අනුව, මිලදී ගන්නා ලද 53[11] x 18.5[11] x 24.5[11] ප්‍රමාණයෙන් ලාච්චු 04 ක් සහිත ස්ටීල් කැබිනට්ටුව සඳහා 2011 සැප්තැම්බර් 19 දින වවුචර් අංක 1551 න් සහ 2011 නොවැම්බර්15 දින 1863 න් රු.15,904 බැගින් දෙවරක් මුදල් ගෙවා තිබුණි. වැඩිපුර ගෙවා තිබු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

අපද්‍රව්‍ය කලමනාකරණ අධිකාරිය මගින් කැස්බෑව නගර සභාව වෙත පිළිවෙලින් 2009 ජනවාරි 20 දින හා 2011 දෙසැම්බර් 14 දින පරිත්‍යාග කර තිබූ ට්‍රැක්ටර් 04 ක් සහ ට්‍රේලර් 07 ක් සභාව වෙත පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමණාකරණය
(ඉ) ණයගැති / ණයහිමි පාලනය